# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2069/21 - 2018 මැයි මස 02 වැනි බදාදා - 2018.05.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක : 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරි ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට රත්මලාන - මොරටුව අපජල ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘති අදියර II යටතේ ද්විතියික පොම්පාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අප්‍රේල් මස 25 වැනි දින,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1361

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 546 B-විහාර ග්‍රාම නිලධාරි වසමේ රජමාවත ගමේ පිහිටි අංක 79/1 නිවාස ඉඩමට යන පාරේ දකුණු දිශාවට මායිම් වූ ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 05ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ගාලුපාර දෙසට යන රජ මාවත ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | අංක 79/1 නිවාස ඉඩමට යන පාර. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :* සොයාගත නොහැක.

05-469

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක : 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ගලගෙදර මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතියේ ස්ථාන භාර නිලධාරී කාර්යාලය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අප්‍රේල් මස 25 වැනි දින,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1370

**උපලේඛනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 677 මාවතගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මාවතගම ගමේ පිහිටි ඩෙන්වර්වත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් රූඩ් 02ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : ප්‍රාදේශීය ලේකම් සතු රජයේ ඉඩම ;
*නැගෙනහිරට* : ප්‍රාදේශීය ලේකම් සතු රජයේ ඉඩම ;
*දකුණට* : ඒ10 මහනුවර - කුරුණෑගල ප්‍රධාන මාර්ගය ;
*බටහිරට* : කොට්ඨාස අධ්‍යාපන කලාප කාර්යාලය සඳහා වෙන් කරන ලද ඉඩම.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ප්‍රාදේශීය ලේකම්,
මාවතගම.

05 -470

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක : 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට නායයාමෙන් අවතැන් වූවන් සඳහා ඉදිකරන නිවාසවලට ජල සැපයුම් ලබාදීමට තුළුමං ළිඳක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අප්‍රේල් මස 25 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1358

## උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෝරාගම්මන 47/C ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මෝරාගම්මන ගමේ පිහිටි පන්සල්වත්ත හා විහාරවත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 1.2ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : එම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : එම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : එම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* : එම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* : 01. පූජ්‍ය පුවක්මොටේ ධම්මරතන ස්වාමීන් වහන්ස,
මයුරපාද රාජමහා විහාරය,
මෝරාගම්මන,
අරණායක.

02. මහා භාරකරු,
මහා භාරකාර දෙපාර්තමේන්තුව,
බුලස් පාර,
කොළඹ 07.

05 -471